# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2497/33 - 2026 ජූලි මස 15 වැනි බදාදා - 2026.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (ආ) වගන්තිය යටතේ**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ තුවාන් ෆාහිම් මොහමඩ් අබ්දුල්ලා මහතා අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වන්නි ආරච්චිගේ ප්‍රසන්න සංජීව රොඩ්රිගු මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාර, ක්‍රියා කරමින් වන්නි ආරච්චිගේ ප්‍රසන්න සංජීව රොඩ්රිගු මහතා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**
තේරීම්භාර නිලධාරි,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

2026 ජූලි මස 14 වැනි දින,
කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය.

EOG 07 - 0180

1A - PG 7804 — 04 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*